**ජාතික පසු අස්වනු කළමනාකරණ ආයතනය - 2021**

-------------------------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

----------------

### 1.1 තත්ත්වාගණනය කළ මතය

--------------------------------------

ජාතික පසු අස්වනු කළමනාකරණ ආයතනයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළයුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර,ආයතනයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නාවූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

---------------------------------------------

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

-----------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය ආයතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්වී ඇති බව සහ හෙළිදරව්කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ආයතනයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ආයතනය ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

---

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

---

ගනුදෙනු කළමනාකාරිත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරිබලය සහිතව ක්‍රියාත්මක කිරීම,අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම,කළමනාකාරිත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරි බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම් කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාලවකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදීය සඳහා සාධාරණ තහවුරුවක් ලබා ගැනීමට ප්‍රමාණවත් "මනා ලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගන යාම අවශ්‍ය වේ.

### 1.5.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 20 හි 117 (ඇ) ඡේදය ප්‍රකාරව අස්පෘශ්‍ය වත්කමක් දේපළ පිරියත හා උපකරණ යටතේ පෙන්නුම් නොකර මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ වෙනම අයිතමයක් ලෙස පෙන්නුම් කළ යුතු වුවද පිරිවැය රු.1,325,836 ක් වූ පරිගණක මෘදුකාංග වටිනාකම මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ දේපළ පිරියත හා උපකරණ යටතේ දක්වා තිබුණි. | ශ්‍රීලංකා රාජ්‍ය අංශ ගිණුම් ප්‍රමිත අංක 20 අනුව අස්පෘශ්‍ය වත්කමක් ලෙස වෙනම ගිණුම් ප්‍රකාශ වල දැක්වීමට කටයුතු කරන බව දන්වා සිටිමි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව අස්පෘශ්‍ය වත්කම් ගිණුම්ගත කළ යුතුය. |

### 1.5.3 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) 2021 දෙසැම්බර් 31 දිනට ගබඩාවේ පැවති පිරිවැය රු.2,210,815 ක් වූ විවිධ තොග අයිතම 06 ක වටිනාකම හා අංශ 03 කට අයත් පිරිවැය රු.884,883 ක තොග අයිතම මූල්‍ය ප්‍රකාශනවල ගලපා නොතිබුණි. එම නිසා සමාලෝචිත වර්ෂයේ ඌණතාවය රු.3,095,698 ක් වැඩියෙන්ද ජංගම වත්කම් එම ප්‍රමාණයෙන් අඩුවෙන්ද මූල්‍ය ප්‍රකාශනවල දැක්වුණි. | විගණනය විසින් පෙන්වා දී ඇති තොග අයිතම සමාලෝචිත වර්ෂයේ ගිණුම්ගත කර නොතිබූ බැවින් ඒවා හඳුනාගෙන ගිණුම් ගත කළ බව සඳහන් කර සිටිමි. | ගිණුම් කාලච්ඡේදයට අදාල ජංගම වත්කම් හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශනවල ගැලපීමට කටයුතු කළ යුතුය. |
| (ආ) ඉකුත් වර්ෂ වලට අනුව ඉදිරි වර්ෂ වලට අදාළ එකතුව රු.2,733,795 ක වියදම් සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ආදායමට ගලපා තිබීම නිසා සමාලෝචිත වර්ෂයේ ඌණතාවය රු.3,894,996 ක් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දැක්වුණි. | ආයතනය මෙතෙක් පවත්වාගෙන එනු ලැබූ ගිණුම් ප්‍රතිපත්ති අනුව ආයතනයේ ගිණුම් තැබීම නිවැරදි අතර ගිවිසුම්ගත ගෙවීම් සම්බන්ධයෙන් පරීක්ෂා කර බලා අදාළ නිවැරදි කිරීම් සිදු කිරීමට කටයුතු කරමි. | ගණුදෙනු හා සිදුවීම් වලට අදාල මූල්‍ය ප්‍රකාශන සැසඳුම් නිවැරදිව දැක්වෙන පරිදි කාලපරිච්ඡේදයට අදාළව නිවැරදි වටිනාකම් ගිණුම්ගත කළ යුතුය. |

## 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| (I.) මු.රෙ.371 (2)(අ) | කාර්යය නිශ්චිතව හඳුනාගැනීමකින් තොරව ක්‍රියා කිරීම හේතුවෙන්, 2021 වර්ෂයේදි අවස්ථා 12 කදී ලබාදෙන ලද එකතු වටිනාකම රු.194,720 ක් වූ අත්තිකාරම්, වියදම් දැරීමකින් තොරව/ සියයට 50 ට වඩා අඩු වටිනාකමින් වියදම් දැරීමෙන් මුදල් මඟින්ම නැවත පියවා තිබුණි. එමෙන්ම අදාළ මුදල කාර්යාලය වෙත ගෙවීමේදී ද සැලකිය යුතු කාල ප්‍රමාදයක් සහිතව ගෙවීම් කර තිබුණි. | පසුගිය කාලයේ ඇති වූ ප්‍රායෝගික තත්වයන් මත විවිධ පර්යේෂණ හා සංවර්ධන කටයුතු සඳහා ලබාගත් අත්තිකාරම් සම්පූර්ණයෙන් වියදම් කිරීමට නොහැකි විය. කෙසේ වෙතත් මෙම තත්වය අවම කර ගැනීම සඳහා අදාල නිලධාරින් වෙත උපදෙස් ලබා දී ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (II.) මු.රෙ 880 (1) සහ මු.රෙ 881 | ඇප අඥා පනතට අනුව ඇප තැබිය යුතු කිසිඳු නිලධාරියෙකුගෙන් ඇප ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. | මෙම චක්‍රලේඛය අනුව ඉදිරියේදී සොයා බලා අවශ්‍ය කටයුතු කරනු ලැබේ. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) 2008 පෙබරවාරි මස 06 දිනැති අංක 05/2008 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | සියලුම රාජ්‍ය ආයතන විසින් පුරවැසි සේවාලාභී ප්‍රඥප්තිය හඳුන්වාදිය යුතු වුවත් විගණිත දින වූ 2022 ජනවාරි 28 දින වන විටත් ආයතනය විසින් පුරවැසි සේවාලාභී ප්‍රඥප්තිය පිළියෙල කර නොතිබුණි. | විගණනය පෙන්වා දී ඇති පරිදි ආයතනය විසින් සපයනු ලබන සේවාවන් සේවා ලාභීන් වෙත කෙසේ සපයන්නේද පිළිබද නිරූපනය වන පරිදි පුරවැසි ප්‍රඥප්තියක් පිළියෙල කරන බව දන්වා සිටිමි. | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ 2003 ජුනි 02 දිනැති අංක PED/12 දරන චක්‍රලේඛයේ රාජ්‍ය ව්‍යාපාර යහපාලනය සම්බන්ධයෙන් නිකුත් කරනු ලැබූ මාර්ගෝපදේශ | ජාතික විගණන කාර්යාලය විසින් නිකුත් කරන ලද විගණන වාර්තාවන් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීි එහි ඇතුළත් කරුණු සමාලෝචනය කර අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු වුවත් 2019 ජනවාරි සිට 2021 දෙසැම්බර් මාසය දක්වා පැවැති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වාර 14 තුළ | ජාතික විගණන කාර්යාලය නිකුත් කරනු ලබන විගණන විමසුම් අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කරන අතර අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සාකච්ඡා කොට ගතයුතු තීරණයන්ට එළඹේ. | විගණන නිරීක්ෂණ සම්බන්ධයෙන් අධ්‍යක්ෂක මණ්ඩලයේ සාකච්ඡා කළ කරුණු එළඹී තීරණ සහ ඒ සම්බන්ධ ගත් |

| | | | | |
|---|---|---|---|---|
| අත්පොතේ ඡේදය 4.2.6 | | එකී විගණන වාර්තාවල ඇතුළත් කරුණු සමාලෝචනය කර විසඳුම් ලබාදීමට කටයුතු කර නොතිබුණි. | | ක්‍රියා මාර්ග වල ප්‍රගතිය තහවුරු වන පරිදි සාකච්ඡා සටහන් ලිඛිතව පවත්වා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | 2015 ජූලි 14 දිනැති චක්‍රලේඛ අංක 03/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | තත්කාර්ය අතුරු අත්තිකාරම් නිකුත් කළ යුත්තේ මාණ්ඩලික තත්ත්වයේ නිලධාරීන්ට පමණක් වුවද, ද්විතියික හා ප්‍රාථමික සේවා ගණයට අයත් නිලධාරීන් 08 දෙනෙක් සඳහා සමාලෝචිත වර්ෂය තුළ තත්කාර්ය අතුරු අග්‍රිම ලබාදී තිබුණි. | මාණ්ඩලික නිලධාරීන්ගේ අධීක්ෂණය යටතේ අධ්‍යක්ෂකගේ අනුමැතිය සහිතව වෙනත් නිලධාරීන්ටද අත්තිකාරම් නිකුත් කරනු ලබයි. | රාජ්‍ය මුදල් චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

---

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

---

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.2,251,969ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 4,719,340 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.2,467,371ක ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට භාණ්ඩාගාරයෙන් පුනරාවර්ථන ලැබීම් රු.10,488,378 කින් වැඩිවීමද, වෙනත් වියදම් රු.1,888,951 කින් සහ ව්‍යාපෘති වියදම් රු. 19,297,457 කින් අඩුවීමද ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

---

ඉකුත් වර්ෂට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ප්‍රධාන ආදායම් සහ වියදම් විෂයයන් වල ප්‍රවණතා පහත පරිදි විය.

| ප්‍රභවය | 2020 | 2021 | වෙනස | ප්‍රතිශතය |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | % |
| වෙනත් ව්‍යාපෘති වලින් මාරු කිරීම | 64,663,687 | 44,696,747 | (19,966,940) | (31) |
| පාරිභෝගික ද්‍රව්‍ය හා සැපයුම් | 9,676,817 | 14,425,984 | 4,749,167 | 49 |
| ව්‍යාපෘති වියදම් | 64,663,687 | 45,366,230 | (19,297,457) | (30) |

### 2.3 අනුපාත විශ්ලේෂණය

---

ඉකුත් වර්ෂයේ ජංගම වත්කම් අනුපාතය 1: 1.4 ක් වූ අතර සමාලෝචිත වර්ෂයේදී එය 1:1.7ක් ලෙස වර්ධනය වී තිබුණි. ක්ෂණික වත්කම් අනුපාතය 1: 1.26 සිට 1: 1.01 දක්වා අඩුවී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

## 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) පර්යේෂණ සිදු කිරීම හා එහි ප්‍රතිඵල සමාජගත කිරීම ආයතනයේ ප්‍රධාන කාර්යයභාරයක් වුවද 2015 සිට 2020 වර්ෂය දක්වා කාල පරිච්ඡේදය තුළ සිදු කර ඇති පර්යේෂණ 16 ක අවසන් වාර්තා පිළිගත් සඟරාවක හෝ සමුළුවකට ඉදිරිපත් කර නොතිබීම, පර්යේෂණ කාලය අවසන් වී ඇති පර්යේෂණ 05 ක අවසන් වාර්තා මෙම වාර්තාවේ දින වන විටත් ඉදිරිපත් කර නොතිබීම 2015 වර්ෂයෙන් පසු ආරම්භ කර මේ වන විට අවසන් කර ඇති පර්යේෂණ ව්‍යාපෘති 04 ක ප්‍රතිඵල සමාජගත කිරීමට ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබීම යන කරුණු විගණනයේදී නිරීක්ෂණය විය. | පර්යේෂණ 16 ක අවසන් වාර්තා පිළිගත් සඟරාවක හෝ සමුළුවක ඉදිරිපත් කිරීමටත්, පර්යේෂණ 05 ක අවසන් වාර්තා ඉදිරිපත් කිරීමටත් පර්යේෂණ ව්‍යාපෘති 04 ක ප්‍රතිඵල සමාජගත කිරීමටත් තිබෙන බව සඳහන් කරමි. | පර්යේෂණ වල අවසන් වාර්තා පිළිගත් සඟරාවක හෝ සමුළුවක ඉදිරිපත් කිරීමටත්, පර්යේෂණ නිම කළ පසු කාලීනව අවසන් වාර්තා ඉදිරිපත් කිරීමටත් පර්යේෂණ ව්‍යාපෘති වල ප්‍රතිඵල සමාජගත කිරීමටත් අවශ්‍ය කටයුතු සිදු කළ යුතුය. . |
| (ආ) ජාතික පසු අස්වනු කළමණාකරන ආයතනයේ ක්‍රියාත්මක සෑම පර්යේෂණ ක්‍රියාවලියකින්ම පසුව නව උත්පාදන නිෂ්පාදනය කර සමාජගත කිරීම ප්‍රධාන අරමුණක් වේ. නමුත් සිදුකරන ලද විගණන පරීක්ෂාවේදී 2000 වර්ෂයේ සිට 2021 දක්වා වූ වර්ෂ 21 ක කාලය තුළ යාන්ත්‍රික වැඩපොළේ පවත්වාගෙන යන නිෂ්පාදිත යන්ත්‍ර සහ උපකරණ ලේඛනය අනුව එළිදක්වා ඇති නව උත්පාදන යන්ත්‍ර වර්ග 19 න් යන්ත්‍ර වර්ග 02 ක් පමණක් සමාජ ගත කර තිබුණි. | මෙම බොහෝ යන්ත්‍ර පර්යේෂණ මඟින් හඳුන්වා දී වසර 10ට වඩා වැඩි බැවින් යන්ත්‍ර සමාජ ගත කිරීමේ අපහසුතායක් පවතී . | සමාජ අවශ්‍යතාවය හඳුනාගෙන යන්ත්‍ර නිපදවීමටත් ඒවා කාර්යක්ෂමව සමාජගත කරමින් ආයතනයේ කාර්යයසාධනය ඉහළ නැංවීමටත් කටයුතු කළ යුතුය. |

## 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2016 වර්ෂයේ සිට 2019 අගෝස්තු මාසය දක්වා කාලය තුළ ක්‍රියාත්මක කර තිබූ පළතුරු ඉදවීමට කාබනික ක්‍රම හඳුන්වා දීමේ පර්යේෂණයේ | මේ ආශ්‍රිතව පර්යේෂණ ප්‍රකාශන 03 ක් සිදු කොට ඇත. නමුත් පර්යේෂයේ ප්‍රධාන අන්වේශක වරිය සේවයෙන් | ව්‍යාපෘති සැලසුම් කිරීමේදී හා ක්‍රියාත්මක කිරීමේදී අපේක්ෂිත අරමුණු ඵලදායී ලෙස ඉටුකර ගැනීමට කටයුතු කළ යුතු අතර |

| | | |
|---|---|---|
| (Induction Of Fruit Ripening By Organic method) සොයා ගැනීම් සඳහා පේටන්ට් අයිතිය ලබා ගැනීම හා පර්යේෂණයේ ප්‍රතිඵල වාණිජ මට්ටමින් ප්‍රචලිත කිරීම සඳහා රු.9,572,715ක් වැය කර තිබුණද, 2022 ජනවාරි 28 දින වන විටද මෙම ව්‍යාපෘතිය ක්‍රියාකාරී මට්ටමේ නොපැවතුණි. | ඉවත්වීම හේතුවෙන් අදාල කාල රාමුව තුල පර්යේෂණය නිම කිරීමට නොහැකි විය. මෙහි උපකරණ තවමත් පර්යේෂණ හා සංවර්ධන කටයුතු සඳහා භාවිතා කරයි. වාණිජ මට්ටමේ ශක්‍යතාව අඩු නිසා පේටන්ට් බලපත්‍ර ලබා ගැනීම සිදු නොවුණි. | පර්යේෂකයන් විසින් අතරමඟ පර්යේෂණ නවතා දැමීම හේතුවෙන් නිෂ්කාර්යය වන පර්යේෂණ වියදම් වගකිවයුත්තන්ට අධිභාර කිරීමට අභ්‍යන්තර පාලන ක්‍රමයක් ස්ථාපිත කළ යුතුය. |

## 3.3 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2015 වර්ෂයේදී විද්‍යාගාර පර්යේෂණ කටයුතු සඳහා රු.15,216,575 කට මිලදීගෙන තිබූ හා වාර්ෂිකව රු. 275,000ක නඩත්තු වියදමක් දරමින් පූර්ණ වායුසමන තත්ත්වයක පවත්වා ගෙන යන Gas Chromatograph Mass Spectrometer (GCMS) යන්ත්‍රය 2022 අප්‍රේල් අවසානය දක්වාම භාවිතයට නොගෙන නිෂ්කාර්යව පැවතුණි. මෙම යන්ත්‍රය විධිමත් පරිදි නඩත්තු කිරීමට අධික පිරිවැයක් දැරිය යුතු බැවින් ප්‍රයෝජනවත් රාජ්‍ය ආයතනයක් වෙත ලබාදීමේ හැකියාව පිළිබඳවද ඉහළ කළමනාකරණයේ අවධානය යොමු වී නොතිබුණි. | යන්ත්‍රය 2015 සිට අවස්ථා කීපයක් භාවිතා කර ඇති අතර එය ආයතනයේ පර්යේෂණ සඳහා භාවිතා කිරීමට අවශ්‍ය කටයුතු සැලසුම් කර ඇත. | යන්ත්‍රය අඛණ්ඩව භාවිතයට ගැනීමට හෝ ප්‍රයෝජනවත් රාජ්‍ය ආයතනයක් වෙත පැවරීමට කළමනාකරණය අවධානය යොමු කළ යුතුය. |
| (ආ) කෘෂිකර්ම අමාත්‍යාංශයේ ප්‍රතිපාදන උපයෝගී කරගෙන ජාතික ආහාර නිෂ්පාදන වැඩසටහන යටතේ ආනයන කරනු ලබන ආහාර වර්ග 07 ක, බැරලෝහ වර්ග 04 ක් අන්තර්ගතව තිබේද යන්න පරීක්ෂා කිරීමට ක්‍රියාත්මක කර තිබූ ව්‍යාපෘතිය සඳහා 2017 වර්ෂයේ රු.1,956,120 ක වියදමක් දරා නියැදි 500 ක් පරීක්ෂා කර තිබුණි. ඊට අදාළ ව්‍යාපෘති වාර්තාව අනුව ඇතැම් ආහාර ද්‍රව්‍යවල උපරිම ආරක්ෂක මට්ටම ඉක්මවා Cadmium, Arsenic And Leaf වැනි බැරලෝහ අන්තර්ගත බව තහවුරුකරගෙන තිබුණි. එසේ වුවද, එම වාර්තාවේ නිගමන හා යෝජනා අනුව බැරලෝහ අන්තර්ගත ආහාර ද්‍රව්‍යයන් පිළිබඳ වැඩිදුර පරීක්ෂාවක් ආයතනය විසින් සිදුකර ඒ සම්බන්ධව වගකිවයුතු සියළුම පාර්ශව වෙත නිසි ක්‍රියාමාර්ග ගැනීම සඳහා තොරතුරු ලබාදී නොතිබීම හේතුවෙන් පර්යේෂණ සඳහා වැය වූ මුදල නිශ්කාර්ය වී තිබුණි. | බැරලෝහ විශ්ලේෂණ ව්‍යාපෘතියේ සියළුම වාර්තා කෘෂිකර්ම අමාත්‍යාංශය වෙත ලබා දී ඇත. කෘෂිකර්ම අමාත්‍යාංශයේ අවසරය නොමැතිව වෙනත් පාර්ශව වෙත වාර්තාව ලබා දීමට අවසර නොමැත. | වාර්තාවේ නිගමන හා යෝජනා අනුව බැරලෝහ අන්තර්ගත ආහාර ද්‍රව්‍යයන් ඇති බවට තහවුරු කරගෙන ඇති බැවින් වග කිව යුතු සියලුම පාර්ශව වෙත හෝ ආයතන වෙත නිසි ක්‍රියාමාර්ග ගැනීම සඳහා යොමු කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ඇ) 2017 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා කාලය තුළ ක්‍රියාත්මක කිරිමට සැලසුම් කර තිබූ ශ්‍රී ලංකාවේ කෘෂි බෝගවල සැපයුම් හා අගයදාම කළමනාකරණ ව්‍යාපෘතිය සඳහා 2018 අප්‍රේල් 05 දින රු.1,290,000 ක් වැය කර Gps Trackers unit 100 ක් හා 2018 මාර්තු 22 දින රු.4,680,000 ක් වැයකර Tempered Data Lorggers 130 ක් මිලට ගෙන තිබුණි. 2022 ජනවාරි 28 දින වන විටත් ඉන් Gps Trackers Unit 72 ක් හා Tempered Data Lorggers 09 ක් භාවිතයට නොගෙන ගබඩාවේ පැවතුණි. අදාළ උපකරණ ඵලදායී ලෙස භාවිතයට ගෙන නොතිබීම. හේතුවෙන් එම ව්‍යාපෘතිය සඳහා වැයකර තිබු රු.7,292,332 ක මුදල නිශ්කාර්යය වියදමක් වී තිබුණි. | 2018 වර්ෂයේදී එළවළු සහ පළතුරු සැපයුම්දාමය තුල උෂ්ණත්වය විචලනය වන ආකාරය අධ්‍යයනය කිරීම සඳහා Temperature Loggers මිල දී ගත් අතර 2019 වර්ෂයේ එය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය ප්‍රතිපාදන නොලැබුණු බැවින් අපේක්ෂිත ලෙස අදාල උපකරණ සියල්ල භාවිතා කළ නොහැකි විය. තවද එම සියළු උපකරණ ප්‍රයෝජනයට ගැනීමට අපේක්ෂිතය. | අපේක්ෂිත අරමුණු ඉටුවන ආකාරයට ව්‍යාපෘති සැලසුම් කර ක්‍රියාත්මක කළ යුතුය. |

**3.4 ප්‍රසම්පාදන කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය තුළ විශාල (Large) වර්ගයේ ප්ලාස්ටික් කුඩ 22350 ක් හා අති විශාල (Jumbo) වර්ගයේ කුඩ 10990 ක් රු.53,357,400 ක මුදලකට සැපයුම් ආයයතන 02 කින් මිලට ගෙන තිබුණි. එසේ වුවත් මෙම මිලට ගැනීම් අඛණ්ඩව තාක්ෂණික ඇඟයීම් කමිටුව විසින් නිසි ඇගයීමක් සිදු කර සුදුසු ලංසුකරු ප්‍රසම්පාදන කමිටුව වෙත නිර්දේශ කර නොතිබීමෙන් මිල ගණන් ඉදිරිපත් කර තිබු ආයතන 02 න්ම සම සමව මිලදී ගැනීම් සිදු කිරීම නිසා වෙළඳපල තරඟකාරීත්වය තුළින් වාසි සහිත මිලක් ආයතනයට ලබාගත හැකි අවස්ථාව අහිමි වී තිබුණි. | මෙම සැපයුම්කරුවන් දෙදෙනාගේම මිල ගණන් ඉදිරිපත් කිරීම් වලදී පිරිවිතර වලට අදාලව යම් යම් අඩුපාඩු තාක්ෂණ ඇගයීම් කමිටුව විසින්ද නිරීක්ෂණය කරන ලදී. ආයතනය වෙත භාණ්ඩ ලැබුණු පසු තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් ලැබී ඇති භාණ්ඩ පිරිවිතර සමග නිරීක්ෂණය කර පෙර වර්ෂවලදී මෙන්ම සහතික කරනු ලබයි. මෙහි දී දක්වා ඇති පිරිවිතර සහතික කර ගැනීමට නම් නැවත මේවා විශ්ලේෂණය කළ හැකි විද්‍යාගාරයක් වෙත යැවිය යුතු වේ. | ප්‍රසම්පාදනයේදී වෙළඳපොල තරඟකාරීත්වය මඟින් ආයතනයට වාසි ලැබෙන අයුරින් ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කිරීමටත්, ආයතනය බලාපොරොත්තු වන තාක්ෂණික පිරිවිතර නිවැරදිව ඇගයීම් කිරීමත් භාණ්ඩ ලද පසු එම පිරිවිතර තහවුරු කර ගැනීමෙන් පසු ගෙවීම් සිදු කිරීමටත් කටයුතු කළ යුතුය. |